ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

මාධ්‍ය නිවේදනය

## <u>තාක්ෂණ සහයෝගීතාවය ගොඩනගමින් IIT මැඩ්රාස් ප්‍රවර්තක් ටෙක්නොලජීස් ෆවුන්ඩේෂන් සහ ඩයලොග් ආසියාටා සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබේ</u>

2026 ඔක්තෝබර් 22 වන දින ශ්‍රී ලංකාවේ ඉන්දිය මහ කොමසාරිස් අතිගරු සන්තෝෂ් ජා මැතිතුමා ඉදිරියේදී IIT මැඩ්රාස් ප්‍රවර්තක් ටෙක්නොලජීස් ෆවුන්ඩේෂන් සහ ඩයලොග් ආසියාටා සමාගම අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී.

2. මෙම අවබෝධතා ගිවිසුම මඟින් සහයෝගීතාව සඳහා රාමුවක් ස්ථාපිත කරනු ලබන අතර, ජාත්‍යන්තර පර්යේෂණ හා තාක්ෂණික විශේෂඥ දැනුම ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රය හා විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධ කිරීම එහි අරමුණ වේ. මෙම හවුල්කාරිත්වය යටතේ ප්‍රධාන ක්ෂේත්‍ර පහක් ඔස්සේ සහයෝගීතාව වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. ඒවා නම්, නවෝත්පාදන හා නව ව්‍යාපාර බිහිකිරීම සඳහා පහසුකම් සැලසීම, ව්‍යවහාරික පර්යේෂණ හා විශ්වවිද්‍යාල රසායනාගාර, කෘත්‍රිම බුද්ධිය හා මානව කේන්ද්‍රීය විසඳුම්, කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ කුසලතා හා දක්ෂතා සංවර්ධනය සහ ජාත්‍යන්තර දැනුම හුවමාරුවයි.

3. මෙම අවබෝධතා ගිවිසුමට IIT මැඩ්රාස් ප්‍රවර්තක් ටෙක්නොලජීස් ෆවුන්ඩේෂන් හි ප්‍රධාන විධායක නිලධාරී ආචාර්ය එම්. ජේ. ශංකර් රාමන් මහතා සහ ඩයලොග් ආසියාටා PLC හි සමූහ ප්‍රධාන විධායක නිලධාරී හා විධායක අධ්‍යක්ෂ සුපුන් වීරසිංහ මහතා අත්සන් තැබූහ.

4. ගිවිසුමට අත්සන් තැබීමේ අවස්ථාවට සමගාමීව, ඉන්දිය මහ කොමසාරිස්තුමා ඩයලොග් ආසියාටා හි ජ්‍යෙෂ්ඨ නායකත්ව කණ්ඩායම සමඟ තාක්ෂණය, වෙළඳාම, සැපයුම් දාම සහ විශ්වාසය මත පදනම් වූ හවුල්කාරිත්වය පිළිබඳ අදහස් හුවමාරු කර ගනිමින් සංවාදයක නිරත විය.

5. මෙම අවබෝධතා ගිවිසුම ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර තාක්ෂණික සහ පර්යේෂණ හා සංවර්ධන හවුල්කාරිත්වය තවදුරටත් ඉදිරියට ගෙන යාමට ඉවහල් වනු ඇත.

***

***කොළඹ***

***2026 ඔක්තෝබර් 23***